**කුරුණෑගල ප්‍රාදේශීය සභාව - 2020**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ, ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිතී,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල පොදු පරිපාලනයට අයත් වෙනත් ආදායම් රු.216,056,698 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ද්වි ගණනයක් සිදුවී ඇති අතර, එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල විශ්‍රාම වැටුප් දායක මුදල රු.1,230,470ක් වැඩියෙන්ද සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගෙවිය යුතු මුදල රු.36,594 අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විශ්‍රාම වැටුප් දායක මුදල් ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල ගොඩනැගිලි සංවර්ධනයට දරා තිබුණු රු.6,051,334 ක මුදලක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. | ගොඩනැගිලි සංවර්ධනයට දැරූ වියදම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. |

### 1.6.2 නොසැසදුණු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 06 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම් හා අනුරූපී වාර්තා අනුව වටිනාකම අතර රු.257,322,045 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.6.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 ඊ, ඒ, ඔ, ක වගන්ති මඟින් සභා අරමුදලින් වැය දැරීමේදී 2015 නොවැම්බර් 02 දිනැති අංක 2015/01 දරන පළාත් පාලන කොමසාරිස්තුමාගේ චක්‍රලේඛයේ 03 වගන්තිය ප්‍රකාරව පුද්ගල ඉල්ලීම් මත ලබාදිය හැකි ආධාර වල උපරිම සීමාව රු.25,000 ක් වුවත් ඊට පටහැනිව රු. 500,000 ක ආධාර මුදලක් ලබා දී තිබුණි. මෙම ආධාර ලබාදීමේදී අඩු ආදායම්ලාභියෙකු බව තහවුරු කරගෙන නොතිබූ අතර, හදිසි ආපදාව පිළිබඳවද තහවුරු කර ගැනීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | ගරු මන්ත්‍රීතුමාගේ නිවස සම්පූර්ණයෙන්ම විනාශ වී තිබූ බැවින් මහා සභාව විසින් විශේෂ අනුමැතියක් ලෙස රු.1,000,000 ක මුදලක් අනුමත කර තිබුණි. නමුත් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් රු.500,000 ක් දක්වා අඩු කොට ගරු ආණ්ඩුකාරතුමාට යොමු කිරීමෙන් පසුව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් රු 500,000 ගෙවීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ආධාර ලබාදීමට කටයුතු කළ යුතුවේ. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.23,642,232 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත්කර නොතිබුණි. | උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. සමහර ශේෂ වලට අදාළව උපලේඛන නොමැති බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.147,319,946 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.172,537,833 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති රු.7,735,198 ක වරිපනම් හා බදු හිඟයෙන් රු.5,426,304 ක මුදලක්ද වර්ෂයේ බිල්කිරීම් රු.12,642,457 ක මුදලින් රු.3,997,415 ක මුදලක්ද අයවිය යුතුව තිබුණි. | ඉදිරියේදී හිඟ ආදායම් අය කර ගැනීම සඳහා තවදුරටත් ක්‍රියා කරන බව විගණනය වෙත දන්වා සිටිමි. | හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග යොදාගෙන හිඟ ආදායම් අයකර ගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා ආඥා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය හා වෙනත් ණයගැති ශේෂවල එකතු වටිනාකම රු.281,638,841ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.26,541,753 ක් වූ අතර, වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.1,148,299 ක් වී තිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට අදාල කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට සුදුසු පරිපාලන ක්‍රමවේද අනුගමනය කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විවිධ තැන්පතු හා කර්මාන්ත ණය හිමි ශේෂවල එකතු වටිනාකම රු.392,736,248ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.183,450,387 ක් වූ අතර වසර 5ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.784,627 ක් වී තිබුණි. | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |